OL/2010/40-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | |
|---|---|
| සංගීතය (සිංහල) I,II | පැය තුනයි |
| சங்கீதம் (சிங்களம்) I,II | மூன்று மணித்தியாலம் |
| Music (Sinhala) I,II | Three hours |

## සංගීතය (සිංහල) I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. භූපාලි රාගයට අයත් **නො වන**, එනම්, එහි වර්ජ්‍ය ස්වර වන්නේ,
   (1) රි ම ස්වර ය. (2) ග ප ස්වර ය. (3) ම නි ස්වර ය. (4) ප සං ස්වර ය.

2. යමන් රාගයේ විශේෂ ලක්ෂණයක් වන්නේ,
   (1) කෝමල ධෛවතය යොදා ගැනීම ය. (2) ගන්ධාර ස්වරය සංවාදී ස්වරය වීම ය.
   (3) සියලු ස්වර ශුද්ධ ස්වර වීම ය. (4) තීව්‍ර මධ්‍යම ස්වරය යොදා ගැනීම ය.

3. 'මුදු පතුළ යට ඉඳලා' හා 'රත්න දීප ජන්ම භූමි' යනාදි ගීත සඳහා පදනම් වී ඇති තාලය වන්නේ,
   (1) දාදරා තාලයයි. (2) ත්‍රිතාලයයි. (3) ජප් තාලයයි. (4) දීප්චන්දි තාලයයි.

4. තීව්‍ර මධ්‍යමය, මන්ද්‍ර ශුද්ධ නිෂාදය, කෝමල ධෛවතය, උච්ච කෝමල රිෂභය යන ස්වර පිළිවෙළින්, නිවැරදි ව යෙදී ඇත්තේ,
   (1) ම̣ නි ධ රි̱ ස්වර ඛණ්ඩයේ ය. (2) ම' නි̱ ධ̣ රි̇ ස්වර ඛණ්ඩයේ ය.
   (3) ම' නි̇ ධ රි̱ ස්වර ඛණ්ඩයේ ය. (4) ම' නි̣ ධ̱ රි̱̇ ස්වර ඛණ්ඩයේ ය.

5. කෝමල ගන්ධාරය සහ කෝමල නිෂාදය යෙදෙන මේලය වන්නේ,
   (1) භෛරවී මේලයයි. (2) යමන් මේලයයි. (3) බිලාවල් මේලයයි. (4) කාෆි මේලයයි.

6. සබරගමුව හා උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන අවනද්ධ භාණ්ඩ වන්නේ, පිළිවෙළින්
   (1) දවුල හා යක් බෙරය ය. (2) මද්දලය හා ගැටබෙරය ය.
   (3) ගැටබෙරය හා දවුල ය. (4) දවුල හා ගැටබෙරය ය.

7. / ධ ධිං - / ධ ධ ධිං - / ත තිං - / ධ ධ ධිං - / යන ඨේකාව අයත් වන්නේ,
   (1) ලාවණී තාලයට ය. (2) ජප් තාලයට ය. (3) දීප්චන්දි තාලයට ය. (4) ත්‍රිතාලයට ය.

8. ස ම ග ම රි, රි ප ම ප ග, ග ධ ප ධ ම යනාදි ස්වර අභ්‍යාසයට අනුව, ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය වන්නේ,
   (1) ම නි ධ නි ප (2) ම නි ම ධ ප (3) ම ධ ම නි ප (4) ම ප නි ම ප

9. පෘතුගීසි ජාතිකයින්ගේ සංගීතාංගයක් ලෙස ශ්‍රී ලංකාව තුළ පැතිරී ගිය ගීත විශේෂයක් වන්නේ,
   (1) පසම් ගීතයි. (2) විරිඳු ගීතයි. (3) කෝලම් ගීතයි. (4) කපිරිඤ්ඤ ගීතයි.

10. 'අසෝකමාලා' චිත්‍රපටයේ මියුරු සංගීතය නිර්මාණය කළ සංගීතඥයා වන්නේ,
    (1) මොහමඩ් ගවුස් ය. (2) සෝමදාස ඇල්විටිගල ය.
    (3) පේමසිරි කේමදාස ය. (4) ආනන්ද සමරකෝන් ය.

[ දෙවැනි පිටුව බලන්න.

11. 'මයික්‍රොෆෝනය' යනු ශබ්දය,
(1) ග්‍රහණය කර ගන්නා උපකරණයකි. (2) විචිත්‍රවත් කරන උපකරණයකි.
(3) ඈතට විහිදුවා හරින උපකරණයකි. (4) ප්‍රේංකාරය උපදවන උපකරණයකි.

12. තබ්ලාව වාදනයේ දී දත ම යොද ගනිමින් උපදවනු ලබන අවනද්ධාක්ෂර දෙකක් වන්නේ,
(1) 'කත්' හා 'ත' ය. (2) 'තින්' හා 'ත' ය. (3) 'ටින්' හා 'ධ' ය. (4) 'තිට' හා 'න' ය.

13. සුනිල් ශාන්තයන් විසින් ගායනා කරන ලද ගීතයක් **නො වන්නේ**,
(1) 'ඕලු පිපිලා' ගියයි. (2) 'හඳ පානේ' ගියයි.
(3) 'කෝකිලයන්ගේ' ගියයි. (4) 'ඇසේ මධුර ජීවනයේ ගීතා' ගියයි.

14. සංගීතයෙහි 'ත්‍රිවිධ ලය' යනු,
(1) උච්ච, මන්ද්‍ර හා මධ්‍ය ය. (2) සුළු, මැදුම් හා මහ තුන් තිත ය.
(3) විලම්බ, මධ්‍ය හා දෘත ය. (4) සම්, ඛලි හා අනුතාලය ය.

15. නූර්ති සංගීතය තුළ පිළිබිඹු වන සංගීතාභාසය,
(1) දක්ෂිණ භාරතීය සංගීතාභාසයයි. (2) දේශීය ජන සංගීතාභාසයයි.
(3) වංග සංගීතාභාසයයි. (4) උත්තර භාරතීය සංගීතාභාසයයි.

16. සංගීත නියමයන්ට අනුව ස්වර යුගල වශයෙන් එක වර හඬ නැංවූ විට, වැඩියෙන් ම ස්වර මාධුර්යයක් ගෙන දෙන ස්වර යුගල දෙකක් වන්නේ,
(1) 'ස-නි' හා 'ස-රි' ය. (2) 'ස-ප' හා 'ස-ධ' ය. (3) 'ස-රි' හා 'ස-ග' ය. (4) 'ස-ම' හා 'ස-ප' ය.

17. 'රූ රසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා'
ඉහත කී සේගි පාදයට අදළ සඳැස් මත් ගණන හා ගිමත් ගණන, පිළිවෙළින්,
(1) 26 හා 28 කි. (2) 28 හා 26 කි. (3) 24 හා 26 කි. (4) 24 හා 28 කි.

18. 'දූඩි කළ මාතා පෙම්බර මාතා' යනාදි ග්‍රැමෆෝන් ගීතය ගායනා කළ ගායිකාව වන්නේ,
(1) කෝකිල දේවි විරතුංග ය. (2) රුක්මණී දේවි ය.
(3) වසන්තා සන්දනායක ය. (4) ජී.එස්.බී. රාණි ය.

19. 'අන්න බලන් සඳ රන් තැටියෙන් සුදු' යන ගී පාද බණ්ඩයේ මාත්‍රා සංඛ්‍යාව බැලූ බැල්මට, 16 කි. මෙම ගී පාද බණ්ඩය **ගැයෙන විට** ලැබෙන ගිමත් සංඛ්‍යාව හා එහි තාලය වන්නේ,
(1) 16; ත්‍රිතාලය ය. (2) 24; බෙම්ටෝ ය. (3) 20; ජප්තාලය ය. (4) 28; දීප්චන්දි ය.

20. බමාජ් රාගයේ ස්වර පදනම් කොට ගත් තනු බණ්ඩයක් වන්නේ,
(1) ග ප ධ / නි ස̇ නි / ධ ප ම / ග ම රි (2) නි ධ ප / ම' ග ම' / ප රි ග / රි ස -
(3) ග ග ප / ධ ස̇ - / ස̇ රි̇ ස̇ / ස̇ ධ ප (4) ස ග ම / ප ග ම / නි̲ ධ ප / ධ ම ග

21. ස්වර සප්තකයට අයත් ශුද්ධ, කෝමල, තීව්‍ර ස්වර අවරෝහණ පිළිවෙළට ස්ථාන ගත කළ විට,
(1) (ස̇) නි̲ නි ධ̲ ධ ප ම' ම ග ග̲ රි රි̲ ස වේ. (2) (ස̇) නි නි̲ ධ̲ ධ ප ම ම' ග̲ ග රි̲ රි ස වේ.
(3) (ස̇) නි නි̲ ධ ධ̲ ප ම' ම ග ග̲ රි රි̲ ස වේ. (4) (ස̇) නි නි̲ ධ̲ ධ ප ම ම' ග̲ ග රි̲ රි ස වේ.

22. 'ගසල්' ගායනා ශෛලිය,
(1) මුද්‍රා නාටක ගායනා ශෛලියකි. (2) චිත්‍රපට ගීත ශෛලියකි.
(3) ගීත නාටක ගායනා ශෛලියකි. (4) සරල ශාස්ත්‍රීය ගායනා ශෛලියකි.

23. 'හාර්මනි' (harmony) නොහොත් "ස්වර සංවාද" සිද්ධාන්තය මත පදනම් වූ සංගීත පද්ධතිය වන්නේ,
(1) උත්තර භාරතීය සංගීත පද්ධතියයි. (2) දක්ෂිණ භාරතීය සංගීත පද්ධතියයි.
(3) අපරදිග සංගීත පද්ධතියයි. (4) දේශීය ජන සංගීත පද්ධතියයි.

24. 'දී කිරි දී කිරි ගෙනාව දී කිරි' හා 'ලෝනා මුනි රාජගේ ශ්‍රී දළද පෙන්වමි' යන ගී පාද සමග තාල වාදනය සඳහා සුදුසු තබ්ලා ඡේකා පදය වන්නේ,
(1) ධ ධිං - / ධ ධ ධිං - / ත තිං - / ධ ධ ධිං - (2) ධ ධිං ධ / ධ තූ න
(3) ධ ගෙ න ති / න ක ධි න (4) ධි න / ධි ධි න / ති න / ධි ධි න

25. රි ග̲ රි ස / නි̣ රි ස -
ඉහත සඳහන් වන්නේ ෂඩ්ජය මූලික 'ශ්‍රැතිය' වශයෙන් පිහිටුවා ගෙන, සකස් කරන ලද ස්වර බණ්ඩයකි. මූලික 'ශ්‍රැතිය' **පංචමය** වශයෙන් ගෙන මෙම ස්වර බණ්ඩය සකස් කළ විට, ස්වර බණ්ඩය වන්නේ,
(1) ම ප ධ̲ ප / ම ධ ප - ය. (2) ප ධ̲ ප ම / ග ප ම - ය.
(3) ධ නි̲ ධ ප / ම' ධ ප - ය. (4) නි̲ ස̇ නි̲ ධ / ප ධ ප - ය.

[ තුන්වැනි පිටුව බලන්න.

26. 'ඇහැල මලින් ගස් පිරිලා' යන ගිය,
(1) නරිබෑනා නාට්‍යයේ ගියකි. (2) කුවේණි නාට්‍යයේ ගියකි.
(3) කරදිය මුද්‍රා නාට්‍යයේ ගියකි. (4) කාලගෝල නාඩගමේ ගියකි.

27. 'ජන ගණ මන අධිනායක ජයහේ' යනාදි ගිය,
(1) හින්දි භජන් ගියකි. (2) භාරතයේ ජාතික ගිය ය.
(3) වංග ජන ගියකි. (4) 'ශ්‍රී වික්‍රම' නූර්තියේ ආරම්භක ගිය ය.

28. රජවරුන්ගේ හා ප්‍රභූවරුන්ගේ ගුණ තේජස අතිශයින් වර්ණනා කෙරෙන ගීත විශේෂය වන්නේ,
(1) සින්දු වන්නම් ය. (2) ප්‍රශස්ති ගීත ය. (3) භජන් ගීත ය. (4) නාඩගම් ගීත ය.

29. 'ස ම රි ප ග ධ ම නි' යන ස්වර ඛණ්ඩය අපරදිග සංගීතයේ 'C' ස්වරය ෂඩ්ජ ස්වරය ලෙස (C=ස) සලකා, අපරදිග ස්වර නාම අනුව ලියූ විට,
(1) C F D G E A F B ය. (2) C D E F G A F B ය.
(3) C E F G A F D B ය. (4) D E F G A B C D ය.

30. සරල ගීතවලට ආවේණික වූ සංගීත ලක්ෂණයක් වන්නේ,
(1) ආලාප හා දෙහොරා කොටස් යොද තිබීම ය.
(2) තත් වාද්‍ය භාණ්ඩ බහුල ලෙස භාවිත කිරීම ය.
(3) තාල කීපයකට අයත් තනු ඛණ්ඩවලින් නිර්මිත ව තිබීම ය.
(4) පෙර වාදන හා අතුරු වාදන ඛණ්ඩ මගින් විචිත්‍ර වීම ය.

31. භෛරවි රාගය ආශ්‍රිත ව නිර්මාණය වූ ගීතයක් වන්නේ,
(1) 'මේ සිංහල අපගෙ රටයි' (2) 'සිරි දරු හෙළ දිව පුරාතනේ'
(3) 'ශ්‍රී රාහුල හිමිගේ නාමේ' (4) 'කවාලා විළඳ ජාති'

32. ජප්තාලයට හා දීප්චන්දි යන තාලවලට අයත් මාත්‍රා සංඛ්‍යා වන්නේ, පිළිවෙළින්,
(1) 10, 14 ය. (2) 12, 10 ය. (3) 16, 14 ය. (4) 14, 16 ය.

33. 'ජා ජාරේ අපනේ' යනාදි හින්දි ඛ්‍යාල් ගීතයට පදනම් වන්නේ,
(1) ඛමාජ් රාගය ය. (2) යමන් රාගය ය. (3) භූපාලි රාගය ය. (4) භිම්පලාසි රාගය ය.

34. නාඩගම් සංගීතය සඳහා ආභාසය ලබා ගෙන ඇත්තේ,
(1) උත්තර භාරතීය සංගීතයෙනි. (2) පෘතුගීසි ගායනා ක්‍රමවලිනි.
(3) වන්නම් ගායනා ක්‍රමවලිනි. (4) දක්ෂිණ භාරතීය සංගීතයෙනි.

35. පෙරදිග ශාස්ත්‍රීය සංගීතය හා අපරදිග ශාස්ත්‍රීය සංගීතය ස්වර ප්‍රස්තාර ගත කෙරෙන්නේ, පිළිවෙළින්
(1) අක්ෂර හා ස්වර සංකේත අනුසාරයෙනි. (2) තාල සංඥා හා ස්වර සංඥා අනුසාරයෙනි.
(3) මන්ද්‍ර ස්වර හා උච්ච ස්වර අනුසාරයෙනි. (4) ස්වර සංඥා හා කෝඩ්ස් අනුසාරයෙනි.

36. සිංහල ජන ගී විෂය තුළ වැඩි වශයෙන් පිළිබිඹු වන ලක්ෂණය වන්නේ,
(1) අනායාසාත්මක බව හා කවි ස්වරූපය ය. (2) ස්වර වාද්‍යයට හිමි ප්‍රමුඛ ස්ථානය ය.
(3) සරල ගියකට සමාන පැටලුල ස්වර පරාසය ය. (4) භාරතීය ජන ගීයේ ආභාසය ය.

37. අපරදිග සංගීතයට අනුව මූලික කෝඩ් (Chord) එකක් ලෙස සංගත වීමට සුදුසු ස්වර තුනක් වන්නේ,
(1) ස රි ග, ය. (2) ප ධ නි, ය. (3) ස ම ප, ය. (4) ස ග ප, ය.

38. පෙරදිග සමූහ වාදනයකට වඩා අපරදිග සමූහ වාදනයක (orchestra) නොහොත් සංධ්වනියක, (symphony) විශේෂත්වයක් වන්නේ,
(1) නර්තනය (dancing) හා රංගනය (acting) සමඟ මිශ්‍ර වීම ය.
(2) ගීත ස්වරය (voice) හා මුසු වීම ය.
(3) වාද්‍ය වෘන්දය මෙහෙයවන්නකු (conductor) සිටීම ය.
(4) සම්පූර්ණ සංගීත නිර්මාණය මතකින් (memory) වැයීම ය.

39. 'සුවඳ පද්ම ඕලු ආදි' හා 'පායාලා අඹරේ' යනාදි ගීත, පිළිවෙළින්,
(1) භජන් ගියක් හා ශාස්ත්‍රීය ඛ්‍යාල් ගියක් වේ. (2) නූර්ති ගියක් හා නාඩගම් ගියක් වේ.
(3) ශාස්ත්‍රීය ගියක් හා සරල ගියක් වේ. (4) ජන ගියක් හා නූර්ති ගියක් වේ.

40. තාලයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව දක්වා වූ අඛණ්ඩ මාත්‍රා පරාසය (සීමාව) හඳුන්වනු ලබන්නේ,
(1) ඡන්දස වශයෙනි. (2) විරිත වශයෙනි. (3) ලේකාව වශයෙනි. (4) ආවර්තනය වශයෙනි.

* *

[ හතරවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

සංගීතය (සිංහල) I,II
சங்கீதம் (சிங்களம்) I,II
Music (Sinhala) I,II

## සංගීතය (සිංහල) II

※ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

---

**1.** කෙටි පිළිතුරු සපයන්න.
(i) ස්වරයේ ත්‍රිවිධ ගුණ සහ ත්‍රිවිධ සප්තක නම් කරන්න.
(ii) ස්වර සප්තකයට අයත් ශුද්ධ, කෝමල, තීව්‍ර ස්වර ආරෝහණ ක්‍රමයෙන් පිළිවෙළින් ලියා දක්වන්න.
(iii) භූපාලි රාගයේ මේලය, රාග ස්වර හා රාග ජාතිය ලියා දක්වන්න.
(iv) ලලිත කලාවන් අතුරෙන්, සංගීතයෙහි මූලික මාධ්‍යය සඳහන් කර, සංගීතය යනු කුමක් දැයි සැකෙවින් හඳුන්වන්න.
(v) ඛමාජ් රාගයට අයත් ස්වර ඛණ්ඩයක්, ස්වර සංඛ්‍යාව 12 කට නො අඩු වන සේ ලියා දක්වන්න.
(vi) 'සම්' 'ඛලි' අතර වෙනස, සැකෙවින් පැහැදිලි කොට ත්‍රිතාලයෙහි 'සම්' 'ඛලි' කුමන මාත්‍රා මත පිහිටා ඇද්දැයි සඳහන් කරන්න.
(vii) ගීතයක හෝ වාදිතයක ඇතුළත් 'ස්ථායි' 'අන්තරා' කොටස් දෙකෙහි වෙනස සැකෙවින් පැහැදිලි කොට, රාගධාරි ශාස්ත්‍රීය ගීතයක ස්ථායි කොටසට අයත් ස්වර පාදයක් ප්‍රස්තාර කරන්න.
(viii) ස ගු රි ස, ධ නි ස, ස රි ගු ම ගු, ස රි ස
යන ස්වර මාලාව කුමන රාගයකට අයත් දැයි සඳහන් කරමින්, එහි වාදි සංවාදී ස්වර ලියා දක්වන්න.
(ix) යමන් රාගයට අයත් ගීතයක හෝ වාදිතයක එක් ස්වර පාදයක් නියමිත තාල සංඥා සහිත ව ස්වර ප්‍රස්තාර කර දක්වන්න.
(x) තත්, සුෂිර, ඝන, අවනද්ධ යන භාණ්ඩ වර්ග සතරට අයත් භාණ්ඩ සතරක් පිළිවෙළින් නම් කරන්න.

**2.** (i) කාෆි රාගයට අයත් ආරෝහණ, අවරෝහණ, ජාති, වාදි සහ සංවාදි යන විස්තර ලියා දක්වන්න.
(ii) එම රාගයට අයත් මධ්‍ය ලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස අදාළ පරිදි ගීත ස්වර/ස්වර ප්‍රස්තාර කර දක්වන්න.
(iii) අදාළ රාගයේ මුඛ්‍යාංගය ලියා දක්වන්න.

**3.** (i) දීප්චන්දි තාලයට අයත් ඨේකාව (මූල පදය) නියමිත තාල සංඥා සහිත ව පද ප්‍රස්තාර කර දක්වන්න.
(ii) එම තාලයට අනුව ගායනය කළ හැකි හෝ වාදනය කළ හැකි ඕනෑම ගීතයක් හෝ වාදිතයක් ප්‍රස්තාර කර දක්වන්න.

**4.** (i) "රාගධාරි ශාස්ත්‍රීය ගායන ශෛලියක් අනුව ආලාප තානාලංකාරාදී විචිත්‍ර අංග සහිත ව දීර්ඝ ලෙස නො ගැයෙන, එහෙත් ජනප්‍රිය සරල රාගයක් ඇසුරෙන් නිර්මාණය කොට ගැයෙන, කෙටි ගීතය, 'සරල ශාස්ත්‍රීය' ගීතයකි." එබඳු සරල ශාස්ත්‍රීය ගීතයක් ඕනෑම ගීත ප්‍රභේදයක් ඇසුරෙන් ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න.
(ii) අදාළ රාගය හා තාලය නම් කරන්න.

**5.** (i) නි ස ම, ප ගු, ම ගු රි ස
ඉහත කී රාගයට අයත් මධ්‍ය ලය ඛ්‍යාල් ගීතයක් හෝ වාදිතයක් හෝ ස්වර ප්‍රස්තාර කර දක්වන්න.
(ii) රාගයේ නම ලියන්න.
(iii) ගීතයට හෝ වාදිතයට හෝ උචිත කෙටි තානාලංකාර දෙකක් තාලානුකූල ව ප්‍රස්තාර කරන්න.
(iv) ගීතය අයත් තාලය නියමිත තාල සංඥා සහිත ව පද ප්‍රස්තාර කර දක්වන්න.

[ පස්වැනි පිටුව බලන්න.

**6.** රන් දැකැති ගෙන තිති සැරසෙන වා
රත් රන් පටි ඉන වට දිලිසෙන වා
රිවි දුටු පිනි බිඳු ලෙස පහ වෙන වා
දුම්බර කෙතේ අපි ගොයම් නෙළන වා

ඉහත ජන ගීය තුළින් උදහරණ දක්වමින්, මෙරට ජන ගී ක්ෂේත්‍රය තුළ පවත්නා විරිත්, එළිසමය, රිද්ම, ස්වර ප්‍රභේද, ස්වර පරාසය, ගායන විලාසය, යනාදි කාව්‍ය හා සංගීත ලක්ෂණ පිළිබඳ විවරණයක් කරන්න.

**7.** (i) පහත සඳහන් ස්වර පාද **සතරකින්** ප්‍රකාශ වන රාග හඳුනා ගෙන, ඒවා නම් කරන්න.

(අ) ග ප ධ නි / ස̇ - ධ ප / ග ම ප ග / ම රි ස -
(ආ) ස රි ග රි / ස රි ස ධ̣ / - ස - රි / ග - - -
(ඉ) ස රි̲ ග̲ ම / - ග̲ - රි̲ / ස - ධ̣̲ නි̣̲ / ස - - -
(ඊ) ස̇ නි̲ ධ ප / ම ප ග̲ ම / ප - ග̲ ම / ග̲ රි ස -
(උ) නි ධ - ප / ම' ප ග ම' / ප - - - / ප ම' ග රි

(ii) ඉහත නම් කළ රාග සතරෙහි ආරෝහණ අවරෝහණ ස්වර හා රාග ජාති ලියා දක්වන්න.

**8.** (i) උත්තර භාරතීය රාගධාරි සංගීතයෙහි යොද ගන්නා 'ලක්ෂණ ගීත' යනු කුමක් දැයි සැකෙවින් හඳුන්වන්න.
(ii) 'ලක්ෂණ ගීතයක' ගීත ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න.
(iii) ගීතයට උචිත කෙටි තානාලංකාර **දෙකක්** ප්‍රස්තාර කරන්න.

**9.** සංගීත විෂයට අයත් ස්වර, රාග, තාල, අලංකාර ක්‍රම, වාදන සහාය, පසුබිම් වාද්‍ය යනාදි අංග කෙරෙහි අවධානය යොමු කරමින්, ශාස්ත්‍රීය රාගධාරි ඛ්‍යාල් ගායනයක් සරල, ග්‍රැමෆෝන්, නාට්‍ය සහ චිත්‍රපට ආදි වෙනත් ගීයකින් වෙනස් වන්නේ කෙසේද'යි විමසන්න.

**10.** (i) ස්වර වාද්‍ය භාණ්ඩයක මූලික හස්ත සාධන පුහුණුව සඳහා, ස්වර චක්‍රව යෙදෙන හා භාණ්ඩයේ ස්වර පරාසය පුරා පැතිරී යන ස්වර අභ්‍යාසයක් **හෝ** තාල වාද්‍ය භාණ්ඩයක තාල ආවර්ත සතරක් පුරා විහිදී යන තාල අභ්‍යාසයක් ලියා දක්වන්න.
(ii) ඔබ තෝරා ගත් භාණ්ඩයේ දළ රූප සටහනක් ඇඳ එහි මූලික කොටස් නම් කරන්න.

* * *